# කෘෂි අංශය පදනම් කරගත් සංචාරක ව්‍යාපාරය

සංචාරක ව්‍යාපාරය ලෝකයේ බොහෝ රටවල ආර්ථිකයේ කැපී පෙනෙන අංශයක් බවට පත් ව තිබේ. ශ්‍රී ලංකාව තුළ ද සංචාරක කර්මාන්තය වර්ධනය කිරීමේ ඉහළ විභවතාවයන් රැසක් හඳුනා ගත හැකි ය. මූලිකව ම ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම ඒ සඳහා සාධනීය අවකාශයක් ලබා දී තිබේ. ඉන්දියන් සාගරයේ පිහිටි දූපතක් වීම හා රටක් ලෙස ශ්‍රී ලංකාව තුළ පවතින කාළගුණික හා දේශගුණික තත්ත්වයන් හේතුවෙන් සංචාරකයින් මෙරටට ඇදී ඒමේ ඉහළ ප්‍රවණතාවක් දැකිය හැකි ය. වර්ග කිලෝ මීටර 65610ක් පමණ වන මෙම භූමිය තුළ සංචාරය කරන ඕනෑම අයෙකුට ඉතා කෙටි කාලයක් තුළ විවිධ වූ දේශගුණික අත්දැකීම් ලබා ගැනීමේ හැකියාව පවතී. මේ සියළු තත්ත්වයන් සැලකිල්ලට ගෙන මෙරට සංවර්ධනය කිරීමේ නවමු මාවත් වඩා නිර්මාණශීලී ලෙස යොදා ගැනීමෙන් මෙරට ආර්ථිකය සංවර්ධනය කරා මෙහෙයවීමේ ක්‍රමවේදයන් පිළිබඳව අවධානය යොමු කළ යුතුව පවතී. එවන් ක්‍රම වේදයක් ලෙස කෘෂි කර්මාන්තය මත පදනම් වූ සංචාරක ව්‍යාපාරය හඳුන්වා දිය හැකි ය. ඒ සඳහා වූ බොහෝ සම්පත් මෙරට තුළ හඳුනාගත හැකි වේ. ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටක් වුව ද වර්තමානය වන විට රටේ ආර්ථික සංවර්ධනයට කෘෂි අංශයේ දායකත්වය ක්‍රමයෙන් අඩු වීමක් දක්නට ලැබේ. එය ශ්‍රී ලංකා ආර්ථිකයට දක්වන දායකත්වය 12% පමණ වුවකි. ආර්ථික සංවර්ධනයට කෘෂි අංශයේ දායකත්වය අඩුවීමට වෙළෙඳපොළ ගැටළු යනා දී කරුණු රැසක් බලපා තිබේ. කෘෂි අංශය නැවත නගා සිටුවීම සඳහා එම ක්ෂේත්‍රය තුළ නව්‍යකරණයක් ඇති කළ යුතු ය. ඒ මගින් නව රැකියා උත්පාදනය, කෘෂි අංශය වඩා ආකර්ශනීය සේවා සපයන හා ලාභ ලබන අංශයක් ලෙස වර්ධනය කළ යුතුව ඇත. ඒ සඳහා කෘෂි අංශය, කෘෂි ව්‍යාපාර බවටත්, ගොවියා ගොවි ව්‍යාපාරිකයා බවටත් පරිවර්තනය කළ යුතු ය.

**කෘෂි කර්මාන්තය පදනම් කරගත් සංචාරක ව්‍යාපාරය හඳුනා ගැනීම**

ලෝකය ක්‍රමයෙන් දියුණුවත් ම මිනිසා වඩා කාර්යබහුලත්වයට පත්වන්නට විය. එහි දී මිනිසුන් බොහෝ විට මානසික ආතති තත්ත්වයන්ගෙන් පෙළෙන්නට වූ අතර ඒ සඳහා මිනිසුන් තම මනස නිදහස් කර ගැනීම පිණිස විවිධ වූ කාර්යයන් හි නිරත වීමට පෙළඹුණි. මෙහි දී වැඩි වශයෙන් මිනිසුන්ගේ අවධානය යොමුවන්නට වූයේ පරිසරය හා බැඳුණු ක්‍රියාකාරකම් කෙරෙහි ය. ඒ සඳහා වඩා නිර්මාණශීලී ක්‍රියාකාරකම් ගොඩනගා ගැනීමට මිනිසා උත්සාහ ගන්නා ලදී, එහි ප්‍රතිඵලයක් ලෙස ඉතා මෑත යුගයේ ජනප්‍රියත්වයට පත් මෙම සංකල්පය බොහෝ ආසියාතික රටවල වර්ධනය වන්නට විය. කෘෂි අංශය මත පදනම් වූ සංචාරක ව්‍යාපාරය (agro tourism) මූලික වශයෙන් ම ගොඩනැගෙන්නේ සංචාරක අංශය පදනම් කොට ගැනීමෙනි. සංචාරකයින්ට තම නිවාඩුව ගත කිරීම සඳහා ගොවිපොළකට ගෙවත්තකට හෝ කෘෂි ව්‍යාපාරික ස්ථානයක සිට ඒවායේ අත්දැකීම් ද විඳිමින් තම නිවාඩුව ගත කිරීමට අවස්ථාව සැලසීම කෘෂි කර්මාන්තය පදනම් කරගත් සංචාරක ව්‍යාපාරය යි. එහි දී සංචාරකයාගේ කැමැත්ත මත අවශ්‍ය නම් ඒවා නැරඹීමටත්, නො එසේ නම් තම ශ්‍රමයෙන් ඒවාට දායක වීමෙන් හෝ කෘෂි කටයුතුවල කොටස්කරුවකු වීමෙන් එම අත්දැකීම් ලබා ගැනීමේ අවස්ථාව උදා වේ.

මෙය සංචාරක ව්‍යාපාරයේ නව මුහුණුවරක් ලෙස ද හැඳින්විය හැකි ය. මෙය මූලිකව ම ගොවිපොළ පදනම් කරගත් ව්‍යාපාරයකි. එනම්, පොදුවේ මහජනයාට ගොවිපොළ තුළ යම් යම් කාර්යයන්ට දායක වීමේ අවස්ථාව ලබා දීම, ගොවිපොළ හා බැඳුණු ක්‍රියාකාරකම් නැරඹීම, අධ්‍යයනය කිරීම, නැවුම් නිෂ්පාදන මිල දී ගැනීම මෙන් ම පරිභෝජනය කිරීමේ අවස්ථාවන් ලබාදීම මෙම සංකල්පයේ මූලික අරමුණ යි. මෙහි දී ග්‍රාමීය වශයෙන් ගොවිපලක ක්‍රියාකාරිත්වය පිළිබඳ අත්දැකීමක් නොමැති අයෙකුට නැවුම් අත්දැකීමක් ලබාගත හැකි වේ.

කෘෂි අංශය මත පදනම් වූ සංචාරක ව්‍යාපාරයට පදනම් වන මූලික මූලධර්ම 3කි එනම්,

01. සංචාරකයින්ට නැරඹීමට යමක් පැවතීම. එනම් සතුන්. කුරුල්ලන්. ගහකොළ වැනි ස්වාභාව සෞන්දර්යාත්මක දෑ පැවතිය යුතු ය.

02. සංචාරකයින්ට ගොවිපොළ කටයුතුවලට සහභාගී වීමෙන් අත්දැකීම් ලැබීමේ අවස්ථාවක් පැවතිය යුතු ය. පිහිනීම. කරත්ත පැදීම. පාරම්පරික ක්‍රීඩාවන්ගේ නිරත වීම වැනි විනෝදාත්මක ක්‍රියාවන්ට සහභාගී වීමේ අවස්ථාව

03. මේ සියල්ල අවසානයේ සංචාරකයින්ට මිල දී ගැනීමට යමක් පැවතිය යුතු ය. විශේෂයෙන් ම අත්කම් භාණ්ඩ. නැවුම් එළවළු. පලතුරු විසිතුරු භාණ්ඩ යනාදිය.

කෘෂි අංශය හා බැඳුණු සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමේ දී අංශ 3ක් ඒකාබද්ධ විය යුතු ය. එනම් ගොවියා. ගම හා කෘෂි කර්මාන්තය යන අංශ තුන යි. මෙහි දී ගොවීන්ගේ සාම්ප්‍රදායික ගොවිතැන සමග ම ඒ පිළිබඳව ක්‍රියාකාරී අත්දැකීමක් සංචාරකයින්ට ලබාදීම මෙහි මූලික අරමුණ යි. මෙය ගොවීන්ට තම ආදායම් ඉහළ නංවා ගැනීමේ මාර්ගයක් ද වේ. අනෙක් අතට ශ්‍රී ලංකාවේ ගොවීන් බොහෝ විට තම අස්වැන්න මත ම විශ්වාසය තබාගෙන සිටින අතර යම් හෙයකින් අස්වැන්න අලෙවි කිරීමේ ගැටළුවලට මුහුණ දීමට සිදුවන අවස්ථා බොහෝ ය. එසේ වුව ද, ගොවීන් සංචාරක ව්‍යාපාරය හා එකාබද්ධ කිරීම තුළින් අස්වැන්න ලබාගන්නා අවධිය අතරතුර ඔවුන්ට අමතර ආදායමක් උපයා ගැනීමේ අවස්ථාව හිමි වේ. එය ඔවුන්ගේ දරිද්‍රතාවය පිටු දැකීමටත් ජීවන තත්ත්වය ඉහළ නැංවීමටත් පිටුවහලක් කරගත හැකි ය. එනම් ගොවිපොළක කටයුතු සිදුවන ආකාරය අධ්‍යයනය කිරීමට, නැරඹීමට හා ගොවිපොළක අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව සලසා දීම තුළින් අමතර ආදායමක් ඉපයීම කෘෂි කර්මාන්තය මත පදනම් වූ සංචාරක ව්‍යාපාරයේ එක් ප්‍රධාන අරමුණකි.

මේ තුළින් කෘෂි අංශය තුළ වන ගොවිතැන හා සේවා අංශයක් වන සංචාරක ව්‍යාපාරය අතර සම්බන්ධතාවයක් ගොඩනගා ගත හැකි ය. ඒ තුළින් ගොවියාටත්, සංචාරකයාටත් තෘප්තිමත් විය හැකි අවස්ථාවක් උදා වේ. එය රටක ආර්ථික සංවර්ධනයට සෘජුවමත් රටේ සාමකාමී පරිසරයක් බිහි කිරීමට වක්‍රාකාරවත් දායක කරගත හැකි ය. එමෙන් ම, මේ තුළ ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ව්‍යාප්ත කිරීමේ අවස්ථාව උදා වේ. දැනට කොළඹ. ගාල්ල. මාතර. කළුතර වැනි මුහුදුබඩ ප්‍රදේශවලට සීමා වී ඇති සංචාරක ව්‍යාපාරය ඈත නො දියුණු ගම් දනව් කරා ව්‍යාප්ත කිරීම තුළින් ග්‍රාමීය සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීමේ හැකියාවක් ද පවතී. සංස්කෘතික හුවමාරුවත් සමග ම වඩා සුබදායී අනාගතයක් ග්‍රාමීය දරු දැරියන් වෙනුවෙන් නිර්මාණය කිරීමේ හැකියාව ද මෙහි පවතින අතර බොහෝ ගැටළුවලට මූලිකව ම හේතුවක් ව පවතින භාෂාමය බාධාවන් ඉවත්කර ඈත පිටිසර දරුවන් විශ්ව ගම්මානයේ නිත්‍ය පුරවැසියන් කිරීමේ අවස්ථාව ද මේ හරහා උදා කරගත හැකි ය.

කෘෂි කර්මාන්තය මත පදනම් වූ සංචාරක ව්‍යාපාරය සඳහා පාරිසරික සාධක ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටක් නිසා ම ඊට අවශ්‍ය පාරිසරික සාධක රට තුළ නොඅඩුව ම දැකගත හැකි වේ. එනම් ගංගා, ඇළ දොළ, වැව්, පොකුණු, වනාන්තර, කඳුවැටි මේ සියළු ම ස්වභාව සෞන්දර්යාත්මක අංග ස්වභාව ධර්මයේ නිත්‍ය අංග වශයෙන් දැකගත හැකි ය. අවශ්‍ය වන්නේ එම සම්පත් මනා කළමනාකරණයෙන් යුතුව මෙහෙයවා ගැනීම යි. 2011 වර්ෂය ශ්‍රී ලංකාව නැරඹීමේ වර්ෂය ලෙස සංචාරක අධිකාරිය ගිය වසරේ දී නම් කරන ලදී. එමෙන් ම, සංචාරක අංශය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ දැක්ම වන්නේ විවේකය ගත කිරීම සඳහා දකුණු ආසියාවේ ජනප්‍රිය ම ස්ථානයක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම යි. එහි දී සංචාරක සංවර්ධන අධිකාරිය ග්‍රාමීය ජනතාව ද සංචාරක ව්‍යාපාරයේ කොටස්කරුවන් බවට පත්කොට ඔවුන්ගේ ජීවන තත්ත්වය ද ඉහළ නැංවීමට අපේක්ෂිත ය. මෙම අරමුණු සාක්ෂාත් කරගැනීමට නම් ග්‍රාමීය අංශය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු ය. එහි දී කෘෂි කර්මාන්තය පදනම් කොට ගත් සංචාරක ව්‍යාපාරය සඳහා වැඩි ඉඩකඩක් වෙන් කළ හැකි ය. ඊට හේතු වන්නේ ශ්‍රී ලංකාවේ සමාජයීය හා සංස්කෘතික පදනම අතීතයේ පටන් කෘෂි කර්මාන්තය හා බැඳී පවතින අතර ම මිලියන 20 ට ආසන්න ජනගහනයෙන් 32%ක් පමණ සෘජුව ම කෘෂිකර්මාන්තයේ නියැළී සිටීම යි. මෙරට ග්‍රාමීය ජනතාවගෙන් 70%ක් පමණ කෘෂි කර්මාන්තය ආශ්‍රිත ජීවනෝපායයන් හි නියැළී සිටින අතර ඉන් 25%ක් 30% අතර පිරිසක් තවමත් දරිද්‍රතාවයෙන් පෙළෙන්නෝ ය. මොවුන්ගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහාත්, ග්‍රාමීය සංවර්ධනය සඳහාත්,

කෘෂිකර්මාන්තය මත පදනම් වූ සංචාරක ව්‍යාපාරය යොදා ගත හැකි ය.

**ශ්‍රී ලංකාව තුළ කෘෂි කර්මාන්තය පදනම් කරගත් සංචාරක ව්‍යාපාරය ව්‍යාප්ත කිරීමට ඇති විභවතාවයන්**

ශ්‍රී ලංකාවට වසරකට විදේශීය සංචාරකයින් ලක්ෂ 4 ත් 5 ත් අතර ප්‍රමාණයක් පැමිණෙන අතර වසර 30 ට අධිකව පැවති යුද්ධයේ නිමාවත් සමග එහි යම් වැඩිවීමක් දැකිය හැකි වේ. මේ වසර අවසානය වන විට විදේශිකයින් මිලියන 1.5ක් මෙරටට පැමිණෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ වාර්ෂික වාර්තාවට අනුව 2009 වසරේ මෙරටට පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව 447,890 කි. එය 2008 වසරට සාපේක්ෂව 2.1% ක ඉහළ යාමකි.

ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයින්ගෙන් බහුතරය ආසියානු කලාපයේ සංචාරකයින් ය. ආසියානු සංචාරකයින්ගේ ප්‍රතිශතය මෙරටට පැමිණෙන මුළු සංචාරකයින්ගෙන් 38% කි. ඒ අනුව, ශ්‍රී ලංකාවේ ඉලක්කය විය යුත්තේ යුරෝපියයන් හා මැදපෙරදිග සිටින සංචාරකයින් ය. විශේෂයෙන් ම, මැදපෙරදිග සංචාරකයින් මෙරටට ගෙන්වා ගැනීමට නම් ඔවුන් වඩා ආරක්ෂිත මෙන් ම ඔවුන්ගේ සංස්කෘතික රටාවන්ට ගැලපෙන අයුරින් සංචාරක කර්මාන්තයේ යම් වෙනසක් සිදුවිය යුතු ය. කෘෂි කර්මාන්තය මත පදනම් වූ සංචාරක ව්‍යාපාරය ඒ සඳහා කදිම අවස්ථාවකි. ඊට හේතුව වන්නේ නිදහසේ ඔවුන්ට අත්විඳිය හැකි බොහෝ දෑ මේ හරහා නිර්මාණය කළ හැකි නිසාවෙනි. අනෙක් අතට කාන්තාරවල වෙසෙන ඔවුන්ට වඩාත් ප්‍රිය වන්නේ ස්වභාවික පරිසරයේ රැඳෙමින් අත්දැකීම් විඳ ගැනීමට යි. මේ හරහා පරිසරය විඳිමින් ඔවුන්ගේ සංස්කෘතික අනන්‍යතාවයන්ට බාධා නො වන අයුරින් සංචාරය කිරීමේ අවස්ථාව මෙම සංකල්පය හරහා ඔවුන්ට ලබා දිය හැක.

ශ්‍රී ලංකාව භූමි ප්‍රමාණයෙන් කුඩා වුව ද ලෝකයේ ජීව විද්‍යාත්මක විවිධත්වයෙන් බෙහෙවින් පොහොසත් රටවල් අතරින් විශේෂිත රටක් වශයෙන් සැලකේ. එමෙන්ම, ශ්‍රී ලංකාව ලෝකයේ ජෛව විවිධත්වය ඒකරාශී වූ සංවේදී ස්ථාන 25න් එක් ස්ථානයක් ද වේ. මෙරටට පමණක් ආවේණික ඒක දේශීක සත්ත්ව හා ශාක විශේෂ බොහොමයක් ද දැකගත හැකි ය.

**කෘෂි කර්මාන්තය පදනම් කර ගත් සංචාරක ව්‍යාපාරයේ වාසි**

- ගොවි කටයුතු පුළුල් වීම
- කෘෂි නිෂ්පාදනය වඩා නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම
- කෘෂි අංශයේ නියැළෙන්නන්ගේ ආදායම ඉහළ යාම
- දේශීය දේ සඳහා නව වෙළෙඳපොළක් නිර්මාණය වීම.
- දේශීය නිෂ්පාදන පිළිබඳව නව ප්‍රබෝධයක් ඇති වීම.
- කෘෂි අංශයේ නියැළෙන්නන්ගේ පරිපාලන හා ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය වීම
- දීර්ඝකාලීන ව කෘෂිකර්මය කෘෂි ව්‍යාපාර බවට පත් වීම.
- නව රැකියා අවස්ථා බිහි වීම.

ශ්‍රී ලංකාව පුරා ම පවතින පෞරාණික ගොඩනැගිලි, පූජනීය ස්ථාන, වැව් පොකුණු, ගංගා ඇළදොළ හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාංගන යන සියළු දෑ කේන්ද්‍ර කරගනිමින් කෘෂි කර්මාන්තය පදනම්කොටගත් සංචාරක ව්‍යාපාරය දිරිගැන්විය හැකි අතර දේශීය, පාරම්පරික වෛද්‍ය ක්‍රම ආදිය උපයෝගී කරගනිමින් මෙම අංශය සංවර්ධනය කිරීමේ ඉහළ විභවතාවයක් රට තුළ හඳුනාගත හැකි වේ. එමෙන් ම, ශ්‍රී ලාංකීය සංස්කෘතිය හා බැඳුණු විවිධ උත්සව එනම් අලුත් සහල් මංගල්‍යය, මුට්ටි නැමීමේ මංගල්‍යය, කමත් චාරිත්‍ර වැනි දෑ කෘෂි අංශය මත පදනම් වූ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය උදෙසා යොදාගත හැකි අතර ඒ තුළින් දේශීය දේ පිළිබඳ ජාත්‍යන්තර අවධානයක් ලබා ගනිමින් මෙරට සංවර්ධනයේ තවත් පියවරක් තැබිය හැක.


**ඉන්දිකා පතිරණ**

*පර්යේෂණ නිලධාරිණී*

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු, පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.